museum of modern
and contemporary art
sri lanka

## Quarterly Newsletter #4 - July 2023

සන්දේව් හැන්ඩි සහ ශාර්මිණී පෙරේයිරා අභිරක්ෂණයකළ ‘ආගන්තුකයෝ’ නමැති අපගේ නවතම ප්‍රදර්ශනය 2023 මැයි 3 වනදා විවෘත කෙරිණි. එහි පළමු මාස දෙක තුළ මෙම ප්‍රදර්ශනය අර්ජුන ගුණරත්න (උ. 1976), ධනුෂ්ක මාරසිංහ (උ. 1985), දිනෙල්ක ලියනගේ (උ. 1994), හේමා ශිරෝණි (උ. 1991), හානියා ලුතුෆි (උ. 1989), ඉමාද් මජීඩ් (උ. 1991), ඉසුරු කුමාරසිංහ (උ. 1987), ජනනි කුරේ (උ. 1974), කේ කේ ශ්‍රීනාත් චතුරංග (උ. 1987), නීනා මංගලනායගම් (උ. 1980), රෙජිනෝල්ඩ් එස්. ඇලෝසියස් (උ. 1970), එස්. එච්. හේරත් (උ. 1947), ශ්‍යාමා ගෝල්ඩන් (උ. 1983), ස්ටීවන් චැම්පියන් (උ. 1959), සහ සුමුදි සුරවීර (උ. 1982) යන කලාකරුවන්ගේ කලාකෘති රසවිඳීමට පැමිණි නරඹන්නන් 4000 අධික ප්‍රමාණයක් ආකර්ෂණය කරගත්තේ ය.

මෙම සන්ධිස්ථානී ප්‍රදර්ශනය විදේශිකයන්, පිටස්තරයන්, හෝ අතිචාරීන් ලෙස ආගන්තුකබව ඔවුන් මත සළකුණුකර ඇති විකාරරූපී ආකාර ආමන්ත්‍රණයකිරීමට විවිධ මාධ්‍ය භාවිතකරන සමකාලීන කලාකරුවන් 15 දෙනෙකුගේ කලාකෘති එකට එක්කරයි. ඔබ තවමත් එය නැරඹුයේ නැතිනම් කොළඹ 03, ක්‍රෙස්කැට් බුලෙවාර්ඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාර පරිශ්‍රයට නොවරදවා ම පැමිණෙන්න.

ඊළඟ වසරේ ‘la Biennale di Venezia’ (Venice Biennale) හි අභිරක්ෂක අද්‍රියානෝ පේද්‍රෝසා, එම ප්‍රදර්ශනයේ 60 වන සංස්කරණයේ නම— ‘Foreigners Everywhere’/ ‘සැම තැන ම ආගන්තුකයින්’—පසුගිය මස ප්‍රකාශයට පත්කළේ ය. MMCA ශ්‍රී ලංකාහි ‘ආගන්තුකයෝ’ ප්‍රදර්ශනයේ අන්තර්ගත බොහෝ තේමා සමඟ අහඹු ලෙස සමකාලීකව ඇති ඔහුගේ අභිරක්ෂක පෙළඹවීම් පිළිබඳ කතාකරමින් Venice Biennale අභිරක්ෂක පේද්‍රෝසා කීවේ, “ඔබ කොතැනක සිටියත්, ඔබ සෑමවිට ම, සත්‍ය වශයෙන් ම ඇතුළාන්තයෙන් ආගන්තුකයෙකු වෙයි” යනුවෙනි. මේ අතර ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට, Artforum සඟරාවේ ප්‍රදර්ශන පිළිබඳ ගෝලීය සමීක්ෂණයේ කොටසක් ලෙස ‘නැරඹිය යුතු ම’ ප්‍රදර්ශනයක් ලෙස ‘ආගන්තුකයෝ’ නම්කර ඇත.

‘ආගන්තුකයෝ’ 2023 ඔක්තෝබර් 22 දක්වා මහජන නිවාඩු දිනවල හැර සතියේ දවස් හත ම පෙ.ව. 10–ප.ව. 6 දක්වා විවෘත ය. කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

ලන්ඩන්හි Frieze Week (ඔක්තෝබර් 11–15) අතරතුර ඔක්තෝබර් 12 දින ලන්ඩනයේ The Photographer's Galleryහීදී ආගන්තුකයෝහි' කලාකරුවන්ගේ චිත්‍රපට සැඳෑවක් MMCA ශ්‍රී ලංකා ඉදිරිපත්කරන බව අපි මහත් උද්යෝගයෙන් දැනුම් දෙමු. දිනය වෙන්කර තබාගන්න!

'ආගන්තුකයෝ' ප්‍රදර්ශනයේ අධ්‍යාපන හා මහජන වැඩසටහන්වල කොටසක් ලෙස ලබාදෙන රසවත් වැඩමුළු, ගැලරි කතා, කියවීම් කණ්ඩායම්, සහ තවත් බොහෝ දේ සමග අපගේ සාමාන්‍ය වැඩසටහන්කරණය යළි පැමිණ ඇත. ඔබ වෙනුවෙන් සූදානම් කෙරුණු කුතුහලජනක වැඩසටහන් මොනවාදැයි බැලීමට පහත අමුණා ඇති ලින්කු හරහා අපගේ වෙබ් අඩවියට සහ සමාජ මාධ්‍ය වෙත පිවිසෙන්න.

'ආගන්තුකයෝ' විවෘත කිරීමෙන් පසු ගෙවුණු මාස දෙක තුළ ප්‍රමෝදා වීරසේකර, සහාය අභිරක්ෂක අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහ අපගේ වැඩෙන බාහිර අධ්‍යාපනඥයින්ගේ කණ්ඩායමේ සහයෝගීතාවයෙන් අභිරක්ෂණයකෙරුණු, ඉතා හොඳ අවධානයක් ලැබුණු කැපී පෙනෙන අධ්‍යාපන සහ මහජන වැඩසටහන් රාශියක් අපි පැවැත්වීමු. ඒවායේ විශේෂ අවස්ථා කිහිපයක් පහතින්:

පෙබරවාරි මාසයේදී අපගේ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා ගෝලීය දකුණේ නව කෞතුකාගාරයක් ඉදිකිරීම පිළිබඳව Art In America හි ක්ලෙයාර් වූන් සමග කතාකළා ය.

“මෙම කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ සිටින නිර්මාණශීලීන්ට කලා ක්ෂේත්‍රය තුළ තමාට විශ්වසනීය වෘත්තියක් පවත්වාගත හැකියැයි සිතීමට දිරිගැන්වීමක් ඇති කරාවි යැයි මම බලාපොරොත්තු වෙනවා. අපි සැවොම දැකීමට, අපගේ හඬට ඇහුම්කන් දීමට ඉඩ සලසන විශාල වේදිකාවක් තැනීමට ප්‍රාර්ථනා කරන ප්‍රජාවක් මෙහි සිටිනවා.”

ශාර්මිණී පෙරේයිරා, ප්‍රධාන අභිරක්ෂක, MMCA ශ්‍රී ලංකා

වසර ආරම්භයේදී ඉතා සාර්ථක නවදිල්ලි චාරිකාවකින් පසුව අපගේ ආදිකර්තෘa අනුග්‍රාහකයන් ජූනි 23–25 දක්වා යාපනයේ සංචාරය කළහ. එහිදී ඔවුහු ලංකාවේ පළමු ගෘහ නිර්මාණිත බහුකාර්යය සංස්කෘතික මධ්‍යස්ථානයවන, Studio TeamArchitrave හී මධුර ප්‍රේමතිලක නිර්මාණයකළ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඇතුළු යාපනය පදනම් කරගත් කලාකරුවන්, කලා සංවිධාන, සහ වෘත්තිකයන් කිහිප දෙනෙකු හමුවූහ.